# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 244/3 — 1976 දෙසැම්බර් 20 වැනි සඳුදා — 1976.12.20

ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී


## IV වැනි කොටස—පළාත් පාලනය

### අතුරු ව්‍යවස්ථා

**ගම්සභා ආඥාපනත**

(257 වැනි අධිකාරය) ගම්සභා ආඥා පනතේ 42 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ බියගම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ, ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාවයි.

සී. ඊ. එච්. අමරසේකර,
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්.

1976 නොවැම්බර් 18 දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

**පොදු වෙළඳ පොළවල්**

කොළඹ දිස්ත්‍රික්කයේ බියගම ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පිළිගන්නා ලද වෙළඳ පොළවල් හා පොළවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කොටසේ 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කඩවත පොදු වෙළඳ පොළ සම්බන්ධයෙන් වූ වෙළඳ පොළ ප්‍රදේශය, පහත දක්වා ඇති සීමාවන් තුළ වූ ප්‍රදේශය විය යුතුය.

මායිම් :—

උතුරට : කොළඹ-නුවර පාරේ 9½ සැතපුම් කණුව පිහිටි ස්ථානයට එක එල්ලේ බියගම-මහර ගම්සභා ප්‍රදේශයේ උතුරු මායිමේ සිට එකී මායිම ඔස්සේ, කොළඹ-නුවර පාරේ අංක 11/1 දරන බෝක්කුවේ මධ්‍යය හා එක එල්ලේ වූ ලක්ෂ්‍යයක් දක්වා ඊශාන දෙසටද,

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කොළඹ-නුවර පාරේ අංක 11/1 දරන බෝක්කුවේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා දකුණටද, එතැන් සිට එකී කොළඹ-නුවර පාරේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට අඩි 300 ක් දකුණින් පිහිටි මනඃකල්පිත ලක්ෂ්‍යයක් දක්වා ද, .

දකුණට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කොළඹ-නුවර පාරේ මධ්‍ය ලක්ෂ්‍යය රේඛාවට අඩි 300 ක් සමාන්තරව එකී පාරේ 9½ සැතපුම් කණුව හා එක එල්ලේ පිහිටි ලක්ෂ්‍යයක් දක්වා නිරිත දෙසටද,

බස්නාහිරට : අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කොළඹ-නුවර පාරේ 9½ සැතපුම් කණුව හරහා එකී පාරේ මධ්‍ය රේඛාව දක්වා උතුරු දෙසට, එතැන් සිට ප්‍රදේශයේ උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින්ද වේ.

12-584


1A -ජ 24230—1,545 (76/12)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී